᠎# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1777/16 - 2012 සැප්තැම්බර් මස 24 වැනි සඳුදා - 2012.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

### 64(5) වැනි වගන්තිය යටතේ පුරප්පාඩුවක් පිරවීම

පිළිගත් දේශපාලන පක්ෂයක් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් නාමයෝජනා කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බවට ප්‍රකාශයට පත් කරන ලද මාලනී ෆොන්සේකා මහත්මිය ඉල්ලා අස්වීම හේතුකොට ගෙන හත්වන පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වැනි වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මා වෙත දැනුම් දී ඇති හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස එම දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මා විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එම පුරප්පාඩුව පුරවනු සඳහා මාලනී ෆොන්සේකා මහත්මිය යෝජනා කර ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය වන මම, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ඉහත කී මාලනී ෆොන්සේකා මහත්මිය ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා මාලනී ෆොන්සේකා මහත්මිය හත්වන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කර ගන්නා ලද බව මෙයින් ප්‍රකාශයට කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2012 සැප්තැම්බර් මස 24 වැනි දින,
රාජගිරියේ දී ය.

10-442

1A - G 16655— 355 (2012/9) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.